| මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන | | |
| 7 ශ්‍රේණිය | ස්ථිති විද්‍යුතය | ඒකකය - 02 |

* 1 – 10 දක්වා ඇති ප්‍රශ්න වලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.

**1.** අකුණු ඇති වන ආකාරය පිළිබඳව ප්‍රථම වරට පරීක්ෂණ සිදු කල විද්‍යා යා කවරෙක්ද?

i. ගැලීලියෝ ගැලීලි ii.බෙන්ජමින් ෆ්‍රෑන්ක්ලීන් iii.මයිකල් ෆැරඩේ iv.අයිසැක් නිව්ටන්

**2.** ස්ථිති විද්‍යුතය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා අඩංගු කර නිපදවා ඇති උපකරණයකි.

i. ඡායා පිටපත් යන්ත්‍රය ii. වයලීනය iii.යතුරු ලියනය iv.වියළි කෝෂය

**3.** ධාරිත්‍රකයේ නිවැරදි සංකේතය කුමක්ද?

i.  ii.  iii.  iv. 

**4.** ධාරිත්‍රකවල ගබඩාවන ආරෝපණ ප්‍රමාණය මනින සම්මත ඒකකය කුමක්ද?

i. වෝල්ට් ii.ඇම්පියර් iii.ඕම් iv. ෆැරඩ්

**5. A ප්‍රකාශය : වස්තු යුගලක් පිරිමදින විට + ආරෝපණ ඉවත්ව යාම සිදුවේ.**
**B ප්‍රකාශය : වස්තු යුගලක් පිරිමදින විට - ආරෝපණ ඉවත්ව යාම සිදුවේ.** A හා B ප්‍රකාශ අතුරින්,

i. A පමණක් සත්‍ය වේ. ii. B පමණක් සත්‍ය වේ.
iii. A හා B ප්‍රකාශ දෙකම සත්‍යය iv. A හා B ප්‍රකාශ දෙකම අසත්‍යය

**6.** ස්ථිති විද්‍යුත් ආරෝපණ හොඳින් රඳා පවතින්නේ,

i.සැහැල්ලු ද්‍රව්‍යවලය. ii. විද්‍යුත් සන්නායකවලය iii. විද්‍යුත් පරිවාරකවලය iv. ස්කන්ධය වැඩි ද්‍රව්‍යවලය

**7.** ස්ථිති විද්‍යුත් ආරෝපණ හඳුනා ගැනීමට භාවිතා කල හැකි උපකරණය කුමක්ද?

i. උෂ්ණත්වමානය ii. මාලිමාව iii.වියළි කෝෂය iv. ස්වර්ණපත්‍ර විද්‍යුත් දර්ශකය

**8.** නිවැරදි ප්‍රකාශය කුමක්ද?

i. සජාතීය ආරෝපණ ආකර්ශණය වේ. ii. විජාතීය ආරෝපණ විකර්ශණය වේ.

iii. විජාතීය ආරෝපණ ආකර්ශණය වේ. iv.ඉහත සියල්ලම සත්‍යය වේ.

**9.** ධාරිත්‍රක භාවිතා නොවන උපකරණයකි.

i. ශීතරය ii. ගුවන් විදුලිය iii. බල්බය iv. රූපවාහිනී යන්ත්‍රය

**10.** අකුණු පවතින අවස්ථාවක සිදුකල යුතු උචිතම ක්‍රියාව වන්නේ

i. සරුංගල් යැවීම ii. ගසක් යටට යාමය iii. විවෘත භූමියකට යාමය. Iv. විදුලි උපකරණ විසන්ධි කිරීම.

1) i සිට x දක්වා ඇති ප්‍රකාශ නිවැරදි නම් සලකුණද, වැරදි නම් සලකුණද යොදන්න. ( ල 20 )

(i) වියලි හිසකෙස් මත පිරිමදින ලද පෑන් බටයක් වෙත ඉතා කුඩා කඩදාසි කැබලි ආකර්ෂණය වේ. ( )
(ii) රසායනික ප්‍රතික්‍රියාවන් නිසා හටගන්නා ආරෝපණ ස්ථිති විද්‍යුත් ආරෝපණ වේ. ( )
(iii) ද්‍රව්‍ය යුගලයන් පිරිමැදීමට පෙර ඒවා උදාසීනව පවතී. ( )
(iv) වස්තු යුගලයන් පිරිමැදීමේදී එකක් ධන ලෙසද අනෙක සෘණ ලෙසද ආරෝපණය වේ. ( )
(v) ලෝම රෙදි කැබැල්ලකින් පිරිමදින ලද එබනයිට් දණ්ඩට ධන ආරෝපණ ලැබේ. ( )
(vi) ධාරිත්‍රකයක් තුළ ගබඩා කලහැකි ආරෝපණ සීමා රහිතය. ( )
(vii) වැසි රහිතව අකුණු ඇති නොවේ. ( )
(viii) විදුලි ඉස්ත්‍රික්කය මගින් සිල්ක් රෙදි මැදීමේදී ටික් ශබ්දය ඇති වන්නේ විදුලි කාන්දුවක් නිසාය. ( )
(ix) ධාරිත්‍රකය තුළ ඇති ආරෝපණ ඉවත් වීම විසර්ජනය ලෙස හැඳින්වේ. ( )
(x) විජාතීයව ආරෝපණය වූ වස්තූන් ස්පර්ශ කල විට ඒවා උදාසීන වේ. ( )

2) සේද වලින් පිරිමැද ආරෝපණය කරගත් වීදුරු දණ්ඩක් හා ලෝම වලින් පිරිමැද ආරෝපණය කරගත් එබනයිට් දණ්ඩක් නූල් මගින් ආධාරක වල එල්ලා සෙමින් ළං කරන අවස්ථාවක් ඉහත රූපසටහනේ දක්වා ඇත.



(i) A හා B අතුරින් වීදුරු දණ්ඩ හා එබනයිට් දණ්ඩ පිළිවෙලින් නම් කරන්න
වීදුරු දණ්ඩ : ........................... එබනයිට් දණ්ඩ : .......................................

(ii) පිරිමදින විට දණ්ඩ + ලෙස ආරෝපණය වීමටත් දණ්ඩ - ලෙස ආරෝපණය වීමටත් හේතු සඳහන් කරන්න.
දණ්ඩ : ..........................................................................................................................
දණ්ඩ : ..........................................................................................................................

(iii) ආරෝපිත A හා B දඬු එකිනෙක ස්පර්ශ වීමට සැලැස්වූ විට කවරක් සිදුවේද?
..........................................................................................................................

(iv) (iii) හි සඳහන් ස්පර්ශ කිරීමෙන් පසු නැවත වරක් A හා B දඬු දෙක නැවත වරක් ළං කිරීමෙන් නිරීක්ෂණය වන්නේ කුමක්ද? .......................................................................................................... ( ල 10)

3) **ධාරිත්‍රකයක්, වියළි කෝෂයක් හා ස්විච දෙකක්, ආලෝක විමෝචක ඩයෝඩයකට ( LED ) සම්බන්ධ කර ඇති පරිපථයක් පහත රූපයේ දැක්වේ. ඒ ආශ්‍රිතව පහතින් දක්වා ඇති ඡේදයේ හිස්තැන් පුරවන්න.**




පළමුව ........... ස්විචය විවෘත කර ............. ස්විචය සංවෘත කර ධාරිත්‍රකය ආරෝපණය කරගත යුතුය. ඉන්පසුව ......... ස්විචය විවෘත කර............. ස්විචය ............. කළ විට ආලෝක විමෝචක ඩයෝඩය දැල්වීම නිරීක්ෂණය කළ හැකිය.
( ල 10 )